YEARS IN THE
FIGHT AGAINST
CORRUPTION

TRANSPARENCY
INTERNATIONAL
SRI LANKA
a nation that upholds integrity

කෙටි අධ්‍යයන සටහන්

# ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ

## නීති තන්ත්‍රය කෙරෙහි බලපෑමක් ඇතිකරන නීති

# කෙටි යෙදුම්

ACA - දූෂණ විරෝධී පනත

CBA - ශ්‍රී ලංකා මහ බැංකු පනත

CIABOC - අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

IMF - ජාත්‍යන්තර මූල්‍ය අරමුදල

OSA - මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත

PDPA - පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත

RTI - තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත

RTIC - තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

UNDP - එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන

# 1. හැඳින්වීම

2022 අප්‍රේල් මාසයේ දී ශ්‍රී ලංකාව බංකොලොත්භාවය ප්‍රකාශ කිරීමට හේතු වූ ණය ආපසු ගෙවීමේ අර්බුදයෙන් පසුව, රටේ ව්‍යවස්ථාදායකය කෙටි කළක් තුළ නීති ගණනාවක් සම්මත කරන අදියරකට අවතීර්ණ වී ඇත.[1] මෙම නීති වලින් බහුතරයක් රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ලබා දී ඇති පොරොන්දු අනුව ජාතික ආර්ථිකය ප්‍රතිව්‍යුහගත කිරීම කෙරෙහි අවධානය යොමු කරන, තවත් සමහර නීති මගින් ප්‍රකාශනයේ නිදහස සහ සමාගමයේ නිදහස වැනි පුද්ගලික නිදහස නියාමනය කරයි.

මූලිකව සිදු කරන ලද විශ්ලේෂණයට අනුව, ශ්‍රී ලංකා මහ බැංකු පනත සහ පාර්ලිමේන්තු අයවැය කාර්යාලය පනත වැනි ආර්ථිකය ඉලක්ක කරගත් නීති මගින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීති තන්ත්‍රයට ප්‍රමුඛත්වය දී ඇති බවත්, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම ඒවා කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධ කර ගෙන ඇති බවත් පෙනී යයි. 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනත වැනි නීති ප්‍රතිසංස්කරණ මගින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීතිය පිළිගන්නා නමුත්, රහස්‍යභාවය සම්බන්ධ හේතු මත අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ස්වාධීනත්වයක් ලබා දීම හරහා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීතිය පසෙකට දමයි. තවද, ප්‍රකාශනයේ නිදහස, සමාගමයේ නිදහස සහ පුද්ගලික දත්ත නියාමනය යනාදිය කිරීමට උත්සාහ කරන නීති මගින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීති තන්ත්‍රය පිළිබඳ තැකීමක් නොකරන බව පෙනෙන්නට තිබේ. 2022 වර්ෂයේ සිට ශ්‍රී ලංකාවේ සම්මත කරගන්නා ලද නීති වලට තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීති තන්ත්‍රය සම්බන්ධ කරගෙන තිබේද සහ එසේ නම්, ඒ කෙසේද යන්න හඳුනාගෙන ලේඛනගත කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ.

ඉහත සඳහන් කළ තත්ත්වය ශ්‍රී ලංකාවේ ආණ්ඩුකරණයේ විනිවිදභාවය ඉහළ නැංවීමට දරන ප්‍රයත්නයන්ට සෘණාත්මක ආදර්ශයක් සපයා දෙන අතර, එය තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීතියට අනුකූල නොවීමට අනෙකුත් ආයතන පොළඹවයි. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතට පෙර බලාත්මක කරන ලද නීති 105 ක් පැහැදිලිව ම තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ සීමාවෙන් බැහැර වන බව හෝ එසේ බැහැර වීමට ඉඩ තිබෙන බව එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින් සිදු කරන ලද අධ්‍යයනයක් මගින් දැනටමත් හඳුනාගෙන ඇත. ඉහත සඳහන් කළ නව ප්‍රවණතාවය ට වැඩි අවධානය යොමු කළ යුතු වන්නේ එනිසයි. මෙවැනි පසුබිමක් තුළ, ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී අවකාශය හැකිළී යාමේ තර්ජනයට ලක්ව ඇති බැවින් එය තවදුරටත් හැකිළී යාම වැළැක්වීම සඳහා නිරන්තර මැදිහත්වීම් අවශ්‍ය වේ.

මෙම අධ්‍යයනය 2018 වර්ෂයේ දී ප්‍රකාශයට පත් කරන ලද "තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීති තන්ත්‍රයට අනුකූල වන්නේද යන්න විමසා බැලීම සඳහා නීති සම්පාදනයන් පිළිබඳ සමාලෝචනය" යන මාතෘකාව යටතේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින් සිදු කරන ලද අධ්‍යයනයක් (එ.ජා.සං.වැ.,2018) තවදුරටත් ඉදිරියට ගෙන යාමකි. මෙම අධ්‍යයනය මගින් 2022 වර්ෂයේ සිට ශ්‍රී ලංකාවේ සම්මත කරගෙන ඇති නීති 2016 වර්ෂයේ දී බලාත්මක කළ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත සමග ගැටෙන්නේ කෙසේද යන්න විශ්ලේෂණය කරනු ඇත. ඒ අනුව, මෙම අධ්‍යයනය මගින් පහත සඳහන් දෑ හඳුනා ගනියි:

1. 2022 ජනවාරි මාසයේ සිට 2024 මැයි මාසය දක්වා සම්මත කරගන්නා ලද සියලු ම නීති විශ්ලේෂණය කිරීම මගින් ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීති තන්ත්‍රයට බලපෑමක් ඇති කරන නීති ලැයිස්තුවක්.
2. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සහ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සිදු කරන ලද අධ්‍යයනයෙහි යොදා ගෙන ඇති වර්ගීකරණයට අනුව, එම නීතිවල බලපෑමෙහි ස්වභාවය.
3. ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීති තන්ත්‍රය කෙරෙහි එමගින් ඇති කළ හැකි බලපෑම පිළිබඳ සාකච්ඡාවක්.
4. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීතිය මගහැර යාම සම්බන්ධ නැගී එන ප්‍රවණතා සහ ප්‍රජාතන්ත්‍රවාදයට එමගින් ඇති කරන තර්ජනය.
5. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීති තන්ත්‍රයට බලපෑමක් ඇතිකරන නීති ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වන නිර්දේශ සහ උපාය මාර්ග.

1. පාර්ලිමේන්තුව 2022 සහ 2023 වර්ෂවල සහ 2024 වර්ෂයේ මැයි මාසය දක්වා පිළිවෙළින් නීති 34 ක්, 45 ක් සහ 28 ක් සම්මත කළේ ය. මෙය මෙම වර්ෂවලට පෙර වර්ෂ සමග සංසන්දනය කිරීමේ දී සැලකිය යුතු තරම් සීඝ්‍ර ඉහළ යාමකි.

## 2. ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීති තන්ත්‍රයේ සුවිශේෂී ලක්ෂණ

ශ්‍රී ලංකාවට තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම සුරක්ෂිත කිරීම සඳහා ශක්තිමත් නීති තන්ත්‍රයක් ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වෙනි සංශෝධනය මගින් හඳුන්වා දෙන ලද 14 වෙනි ව්‍යවස්ථාව සහ ඉන් පසුව හඳුන්වා දෙන ලද 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත තොරතුරු වෙත ප්‍රවේශය සහ වගවීම යන දෙඅංශයෙන් ම ශ්‍රී ලංකාවේ ආණ්ඩුකරණය ශක්තිමත් කිරීම සඳහා සැලකිය යුතු බලපෑමක් ඇති කර තිබේ. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව මගින් ලබා දුන් දිගු කාලීන බලපෑමක් සහිත නියමයන්, ඇතැම් රාජ්‍ය ආයතන ප්‍රගාමීව තොරතුරු ප්‍රකාශයට පත් කිරීම, හිතකර ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දු, සහ පාලනය සහ විනිවිදභාවය ඉහළ නැංවීම සඳහා සිවිල් සමාජයේ සාමූහික ප්‍රයත්නයන් ඇතුළු සාධක රැසක් මෙම ජයග්‍රහණ සඳහා දායක වී ඇත.

"තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත 2015 වර්ෂයේ දී හඳුන්වා දෙන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහනව වන සංශෝධනයේ කොටසක් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 වෙනි ව්‍යවස්ථාවට අනුකූලව බලාත්මක කර ඇති අතර, එය නීතිය මගින් විධිවිධාන සලසා ඇති පරිදි තොරතුරු වෙත ප්‍රවේශ වීමට සෑම පුරවැසියෙකුට ම ඇති අයිතිය පිළිගනියි." (එ.ජා.සං.වැ., ප්‍රකාශිත දිනය රහිත, පි. 4). පුරවැසියන්ට මෙම අයිතිය ක්‍රියාත්මක කළ හැකි විෂය පථය සහ යාන්ත්‍රණ මෙම පනත මගින් නිර්වචනය කර ඇත.

"තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන අතර යම් අනනුකූලතාවයක් හෝ ගැටීමක් ඇති අවස්ථාවක, වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන වල කුමක් සඳහන්ව තිබුණද, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන බලාත්මක විය යුතු ය යනුවෙන් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 'එතකුදු වුවත්' වගන්තියෙහි සඳහන් වේ." (එ.ජා.සං.වැ., ප්‍රකාශිත දිනය රහිත, පි. 4). එසේ වුවත්, මෙම වගන්තිය අර්ථ දැක්වීමට තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිෂන් සභාවට සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරුන්ට පුළුල් අභිමතයක් නීතිය මගින් ලැබී ඇති හෙයින් තොරතුරු දැනගැනීමේ අයතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන අනෙකුත් නීති අභිබවා ක්‍රියාත්මකවීම සිදු නොවන අවස්ථා තිබේ.

ගෝලීය තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීති ශ්‍රේණිගත කිරීම තුළ ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීති රාමුව 3 වන ස්ථානයට පත්ව ඇත. ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීතිය වසර අටකට ආසන්න කාලයක් පුරා ක්‍රියාත්මක කිරීම තුළ එම නීතියෙහි ඇති ප්‍රබලත්වය සහ සීමාවන් මොනවා ද යන්න සනාථ වී ඇත. තනි නීතියක් ලෙස ගත් කල එහි ඇති ශක්තීන් පැහැදිලිව පෙනෙන්නට තිබෙන නමුත්, පුරවැසියන්ට එය නුපුරුදු වීම සහ පුරවැසියන් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම භාවිතා නොකිරීම, විනිවිදභාවයෙන් යුත් පාලනයක් සම්බන්ධයෙන් රාජ්‍ය සේවකයින් තුළ ඇති ආකල්ප සහ මැතිවරණ වියදම් පිළිබඳ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන් තීන්දුව ඇතුළු විවිධ සාධක නිසා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීති තන්ත්‍රයේ සාර්ථකත්වය සීමා වී ඇත.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතෙහි, "පුරවැසියෙකුගේ අයිතියක් ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය වූ යම් තොරතුරක් වෙත නීතියෙන් සලසා ඇති පරිදි ප්‍රවේශ වීමේ අයිතිවාසිකම ඇත්තේය" යනුවෙන් දක්වා ඇති 14(අ)(1) අනුව්‍යවස්ථාව පරිදි පුරවැසියන්ගේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම ආරක්ෂා කරන නීතිය ලෙස තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පිළිගෙන ඇත.

තොරතුරු දැනගැනීමේ පනතෙහි විධිවිධාන සහ වෙනත් කවර හෝ 'ලිඛිත නීතියක්' අතර යම් පරස්පරතාවයක් ඇති වුව හොත්, තොරතුරු දැනගැනීමේ පනතෙහි විධිවිධාන බලපැවැත්විය යුතුය යනුවෙන් විධිවිධාන සලසා ඇති එම පනතෙහි 4 වෙනි වගන්තිය, පනත් කෙටුම්පතෙහි 7(3) වෙනි වගන්තියට පටහැනි වන බව අධිකරණය පෙන්වා දුන්නේ ය. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යනු 'නීතිය මගින් විධිවිධාන සලසා ඇති පරිදි' පුරවැසියන්ගේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම ආරක්ෂා කරන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 වෙනි වගන්තියට අනුව 'අදාළ වන නීතිය' වේ.

ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ "මහජන සුභසිද්ධිය අනෙකුත් කරුණු අභිබවා බලපවත්නේය" යනුවෙන් සඳහන් වන 5(4) වෙනි වගන්තිය නිසා එම පනත විශේෂයෙන් වැදගත්

වේ. "මහජන සුභසිද්ධිය එම තොරතුරු හෙළිදරව් කිරීමෙන් වන හානියට වඩා වැඩි නම් එවැනි තොරතුරු සඳහා වන ඉල්ලීමක් ප්‍රතික්ෂේප නොකළ යුතු ය" යනුවෙන් එම වගන්තියෙහි පැහැදිලිව සඳහන් වේ. යම් ව්‍යතිරේකයක් අදාළ වන්නේ වුව ද, එය හෙළිදරව් කිරීම මගින් සිදුවන මහජන සුභසිද්ධිය එම ව්‍යවතිරේකය අභිබවා බලපැවැත්විය හැකි බව මෙයින් අදහස් වෙයි.

## 3. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීතිය සමග ගැටෙන නීති වර්ගීකරණය කිරීම

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත සමග ඇති විය හැකි ගැටුමෙහි ස්වභාවය නිර්ණය කිරීමේ දී, මෙම අධ්‍යයනය මගින් 2018 වර්ෂයේ දී එ.ජා.සං.වැ. විසින් සිදු කරන ලද අධ්‍යයනය මගින් සිදු කළ වර්ගීකරණය අනුගමනය කර ඇත. ඒ අනුව, 2022 වර්ෂයේ සිට සම්මත කරගන්නා ලද නීතිවල බලපෑම පිළිබඳව තුන් වැදෑරුම් වර්ගීකරණයක් භාවිතා කර ඇත.

**<u>1 වෙනි කාණ්ඩය: සෘජු උල්ලංඝනයවීම්</u>**

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධානවලට සෘජුවම පටහැනි වන නීති මෙම කාණ්ඩයට ඇතුළත් වේ. මෙම නීති තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ඇතුළු වෙනත් ඕනෑම නීතියක් අභිබවා බලපැවැත්වෙන බව පැහැදිලිව ප්‍රකාශ කර ඇත, එසේත් නැතහොත් එම නීති තොරතුරු පනත සමග අනුකූල වීමට සකසා නැත. මෙම පරස්පර නීති තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීති තන්ත්‍රය ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම කෙරෙහි සැලකිය යුතු බාධා එල්ල කරයි.

**<u>2 වෙනි කාණ්ඩය: වක්‍ර උල්ලංඝනයවීම්</u>**

මෙම කාණ්ඩය තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතට පටහැනි වන හෝ පටහැනි වීමට ඉඩ ඇති විධිවිධාන අඩංගු වන නීති වලින් සමන්විත වේ. කෙසේවෙතත්, එවැනි විධිවිධාන වෙනත් නෛතික නියමයන්ට යටත් වන බව මෙම නීති වල පැහැදිලිව සඳහන් වෙයි. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතෙහි විධිවිධාන අනෙකුත් නීති අභිභවා බලපැවැත්වෙන බව දැක්වෙන විධිවිධාන ක්‍රියාත්මක කිරීමට මේ නිසා ඉඩ සැලසේ. ඒ අනුව, තොරතුරු ලබා නොදීම සඳහා සාධාරණීකරණය කිරීමක් ලෙස රාජ්‍ය ආයතනවලට එම නීති භාවිතා කළ නොහැකි වේ.

**<u>3 වෙනි කාණ්ඩය: තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම සමග අනුකූල නොවන්නේ යැයි අර්ථකථනය කරනු ලැබීමේ හැකියාව</u>**

අදාළ අධිකාරිය පක්ෂ වන අර්ථ නිරූපණය සහ එක් එක් සිද්ධියේ විශේෂිත තත්ත්වයන් අනුව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධානවලට පටහැනි විය හැකි නීති වලින් මෙම කාණ්ඩය සමන්විත වේ. එයට අමතරව, මෙම නීති වෙනත් ඕනෑම නීතියක විධිවිධාන වලින් ඒවා ස්වාධීන වන බව පැහැදිලිව ප්‍රකාශ කරයි. නැතහොත්, ඒවා බලැපැවැත්වීම සම්බන්ධ කාරණය පිළිබඳව කිසිවක් සඳහන් නොකරයි.

# 4. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීති තන්ත්‍රයට පටහැනි වන නීති

මෙම කොටස මගින් 2022 සිට 2024 මැයි මාසය දක්වා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද සියලු ම නීති විගුගත කර, ඒ අතරින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතට පටහැනි නීති මොනවාදැයි හඳුනාගෙන, පෙර කොටසෙහි දක්වා ඇති වර්ගීකරණයට අනුව ඒවා කාණ්ඩ කර ඇත.

පවතින පනතකට සංශෝධනයක් හඳුන්වා දෙන පාර්ලිමේන්තු පනත් විශ්ලේෂණය කිරීමේ දී, මෙම අධ්‍යයනය මගින් පියවර දෙකක ප්‍රවේශයක් අනුගමනය කළේය. පළමුවෙන් ම, සම්මත කර ඇති සංශෝධනය තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීති තන්ත්‍රය සමග ගැටෙනු ඇත්ද යන්න සොයා බලන ලදී. එවැනි ගැටීමක් තිබෙන බවක් නිරීක්ෂණය නොවූ විට, පූර්වගාමී පනත තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීති තන්ත්‍රය කෙරෙහි බලපාන අයුරු (පෙර අධ්‍යයන මත පදනම්ව) පරීක්ෂා කරන ලදී. මෙම පූර්වගාමී පනත් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීති තන්ත්‍රය සමග ගැටීමක් ඇතිවීමේ විභවයක් තිබුණේ නම් සහ වර්තමාන සංශෝධනය මගින් එම ගැටුම් ඇතිවීමේ විභවය නිවැරදි කර නොතිබුනේ නම්, එම අඩුපාඩුව අවධාරණය කිරීමට 'ප්‍රගතියක් නැත' යනුවෙන් සඳහන් කරන ලදී.

# 5. සාකච්ඡාව සහ විශ්ලේෂණය

මෙම කොටසෙහි දී, ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීතිය අනෙකුත් නීති සමග ගැටිය හැකි ආකාරය සාකච්ඡා කරනු ලැබේ. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම මග හැර යාමේ ප්‍රවණතා සහ ප්‍රජාතන්ත්‍රවාදයට එල්ලවන තර්ජනය විශ්ලේෂණය කිරීම මෙයට ඇතුළත් වේ. 2022 අංක 9 දරන පුද්ගලික දත්ත ආරක්ෂණ පනත සහ 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත 1 වැනි කාණ්ඩයේ උල්ලංඝනයන් සිදු කරන බව, එනම්, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත සෘජුව ම උල්ලංඝනය කරන බව මෙම අධ්‍යයනයේ දී අපි නිරීක්ෂණය කළෙමු. එමෙන් ම, 2024 අංක 9 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත 2 වෙනි කාණ්ඩයේ උල්ලංඝනයක් සිදු කරයි. එනම්, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතට පටහැනි විය හැකි විධිවිධාන එහි අඩංගු වේ. 2023 අංක 10 දරන අපරාධයක වින්දිතයින් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීතිය යටපත් කරන ආකාරයෙන් යම් නිශ්චිත අවස්ථාවන්හි දී අර්ථ නිරූපණය කරනු ලැබීමට ඇති හැකියාව අනුව 3 වන කාණ්ඩයේ උල්ලංඝනය කිරීමක් වන බව ද නිරීක්ෂණය වේ.

ඇතැම් නීති තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීති තන්ත්‍රයට අනුගත වන ආකාරය විශේෂයෙන් කැපී පෙනෙයි. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත පිළිබඳව නිශ්චිතව සඳහන් කර ඇති 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත, 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනත, 2024 අංක 7 දරන ජාතික ජල ශාස්ත්‍රීය පනත සහ 2023 අංක 6 දරන පාර්ලිමේන්තු අයවැය කාර්යාල පනත ඒ සඳහා උදාහරණ කිහිපයක් වේ.

උදාහරණයක් ලෙස, ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 119 වෙනි වගන්තියෙහි තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීති තන්ත්‍රය සමග එම පනතෙහි ඇති සම්බන්ධතාවය පිළිබඳව දක්වා ඇත. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීතියේ 5(1) වගන්තිය පරිදි මහ බැංකුවේ, එහි මුදල් මණ්ඩලයේ සහ සේවකයන්ගේ රහස්‍යභාවය සම්බන්ධ නියමයන් පිළිගන්නා අතර ම, එහි 119(6) වගන්තියෙහි පහත සඳහන් පරිදි පැහැදිලිව ම දක්වා ඇත.

> මේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුවද, 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන බලාත්මක විය යුතු අතර, ඒ අනුව තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ පනතේ විධිවිධාන සහ මේ පනතේ විධිවිධාන අතර යම් අනනුකූලතාවක් හෝ ගැටීමක් ඇති වුවහොත්, මහ බැංකුවේ යම් තොරතුරක් සම්බන්ධයෙන් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

මෙම විධිවිධානය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකමට ප්‍රමුඛත්වය දීම සඳහා ආදර්ශවත් පියවරක් ලෙස ගැටීම් සහිත කාරණාවලදී තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත බලපැවැත්විය යුතු බවට විධිවිධාන සලසා ඇත. කෙසේ

වෙතත්, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවට ලැබෙන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ අභියාචනාවල සඳහන් එක් එක් සිද්ධිය පිළිබඳව මහජන සුභසිද්ධිය සහ රහස්‍යභාවය පිළිබඳ අර්ථ නිරූපණය සම්බන්ධයෙන් තීරණය කිරීමට සිදුවනු ඇත.

එ.ජා.සං.වැ. විසින් සිදු කරන ලද අධ්‍යයනයේ දී හඳුනාගෙන ඇති පරිදි, සංශෝධිත බොහෝ නීති වල තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීතියට පටහැනි වන තත්ත්වයන් එසේම පවතියි. එසේ ගැටීම් ඇතිවන එක් එක් නීතිය පහත සඳහන් කොටසෙහි සාකච්ඡා කර ඇත.

## 5.1 2022 අංක 9 දරන පුද්ගලික දත්ත ආරක්ෂණ පනත - 1 වෙනි කාණ්ඩයේ ගැටීම

### 5.1.1. මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් දෙකක්

පුද්ගලයන්ගේ පුද්ගලික දත්ත ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය සහ මහජන සුභසිද්ධියට අදාළ කාරණා සම්බන්ධ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම අතර පවතින අවිනිශ්චිතතාවය ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික කුළුණු දෙකක් වන විනිවිදභාවය සහ පෞද්ගලිකත්වය පිළිබඳ නියෝජනය කරයි. නිතර උපුටා දක්වනු ලබන, කැනඩාවේ හිටපු අගවිනිසුරු, අතිගරු බෙවර්ලි මැක්ලච්ලින් විසින් සිදු කරන ලද ප්‍රකාශයක් මෙයට වඩාත් හොඳ නිදසුනක් සපයා දෙයි.

> "... [කැනේඩියානු] ප්‍රජාතන්ත්‍රවාදයට නූතන ලෝකයේ සංකීර්ණ සන්දර්භය තුළ හොඳින් ක්‍රියාත්මක වීමට නම්, අයිතිවාසිකම් දෙකක් ආරක්ෂා කළ යුතු වේ - තොරතුරු වෙත ප්‍රවේශ වීමේ අයිතිය සහ පෞද්ගලිකත්වය සඳහා ඇති අයිතිය එම අයිතිවාසිකම් දෙක වේ" (කැනඩාවේ ශ්‍රේෂ්ඨාධිකරණය, 2009).

පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත මගින් සියලු ම පෞද්ගලික දත්ත ආරක්ෂා කරන අතර ම, යම් තොරතුරක් පොදු ක්‍රියාකාරකමකට හෝ මහජන සුභසිද්ධියට අදාළ නොවන පුද්ගලික තොරතුරක් නම්, හෝ එය හෙළිදරව් කිරීම පුද්ගලයෙකුගේ පෞද්ගලිකත්වය අනවසරයෙන් ආක්‍රමණය කිරීමකට තුඩු දෙන්නේ නම්, එම තොරතුරු අනාවරණය නොකර සිටීමට තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත මගින් ඉඩ ලබා දෙන බව පිළිගැනීම වැදගත් වේ. පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත විශේෂයෙන් ම "පෞද්ගලික දත්ත" ආවරණය කරන බැවින්, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව යටතේ ඇති රහස්‍යභාවය පිළිබඳ ආරක්ෂණයන්ට සාපේක්ෂව පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත පෞද්ගලික දත්ත සඳහා පුළුල් ආරක්ෂාවක් ලබා දෙන බවට සැකයක් නැත. පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතෙහි 2 වෙනි වගන්තිය අනුව, පෞද්ගලික දත්ත යන පුළුල් නිර්වචනය යටතට වැටෙන ඕනෑම දත්තයක් හෙළිකිරීමේදී පනතේ දක්වා ඇති පරිදි කැමැත්ත ලබා ගැනීම ඇතුළු අනුකූලතාවය පිළිබඳ නියමයන්ට යටත් වේ. ඉහත සඳහන් කළ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවෙහි නියෝගවලට සැලකිය යුතු පෞද්ගලික දත්ත ප්‍රමාණයක් ඇතුළත් වේ.

මෙම මූලික අයිතිවාසිකම් දෙක කළමනාකරණය කිරීම එකිනෙකට හාත්පසින් ම ප්‍රතිවිරුද්ධ විය යුතු නැත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල එළි දැක්වූ රාජ්‍යකරණ විශ්ලේෂණ වාර්තාව මගින් මෙම එකිනෙකට වෙනස් මූලික අයිතිවාසිකම් තුලනය කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරයි:

"අතිශය වැදගත් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා සහ රාජ්‍යයේ ආරක්ෂාව, පුද්ගලයන්ගේ පෞද්ගලිකත්වය සහ එහි විමර්ශනවල රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා රජයට ඇති යුක්ති සහගත බැඳියාව නිසි ලෙස සමතුලිත වන ප්‍රතිපත්ති සහ නීති ස්ථාපනය කිරීම වැදගත් වනු ඇත. එසේ නොමැති නම්, කැපී පෙනෙන විනිවිදභාවයක් පවත්වාගැනීමේ ඇති ඵලදායිත්වය නැතිවී යාමේ සැලකිය යුතු අවදානමක් ඇත." (ජා.මූ.අ., 2023).

### 5.1.2. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකමෙහි සහ පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතෙහි පවතින ගැටීම්

මෙම සන්දර්භය තුළ, පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතෙහි 40 වැනි වගන්තිය යටතේ සිදු කර ඇති නිදහස් කිරීම් පරීක්ෂා කරනු ලැබීම අවශ්‍ය වේ. 40 වගන්තියේ මෙසේ සඳහන් වේ:

> "මේ පනතේ විධිවිධාන සඳහා වන යම් නිදහස් කිරීමක්, සීමා කිරීමක් හෝ බලහීන කිරීමක් සඳහා යම් නීතියක් මගින් විධිවිධාන සලසනු ලබන අවස්ථාවක සහ මූලික අයිතිවාසිකම් සහ නිදහස යනාදියෙහි හරයට ගරු කිරීම සඳහා සහ - (ඉ) විශේෂයෙන් අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ තොරතුරු දැන ගැනීමේ අයිතීන් ඇතුළුව සහ තැනැත්තන්ගේ මූලික නිදහස සහ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, සඳහා ප්‍රජාතාන්ත්‍රික සමාජයක් තුළ අවශ්‍ය සහ සමානුපාතික පියවර ගනු ලැබීම සඳහා හැර, එවැනි නිදහස් කිරීමකට, සීමා කිරීමකට හෝ බලහීන කිරීමකට ඉඩ ලබාදෙනු නොලැබිය යුතු ය."

තවද, පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතේ 3 වෙනි වගන්තිය මගින් සඳහා අනෙකුත් නීති අභිබවා යන තත්ත්වයක් ඇත කරන අතර, කිසියම් අනනුකූලතාවයක් පවතින අවස්ථාවක දී පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත බලපැවැත්වෙන බවට විධිවිධාන සලසයි. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 4 වෙනි වගන්තියෙහි ද අනෙකුත් නීති අභිබවා බලපැවැත්වීමේ විධිවිධානයක් අඩංගු වේ. මෙම අර්ථයෙන් ගත් කල, කුමන නීතියට ප්‍රමුඛත්වය දිය යුතුද යන්න සම්බන්ධයෙන් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත සහ පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත අතර ගැටීම් ඇත. කෙසේ වෙතත්, සාමාන්‍ය නිදහස් කිරීමේ වගන්තිය 40(ඉ) මගින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීතිය සඳහා යම් ආරක්ෂාවක් සපයන අතර, තොරතුරු දැනගැනීමේ අයිතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ආරක්ෂා කර ඇති අයිතිවාසිකමක් වන බැවින්, පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත තොරතුරු වෙත ප්‍රවේශ වීමේ අයිතිය ඉක්මවා නොයන බව නිගමනය කිරීම සාධාරණ ය. මෙම තත්ත්වය, නීති දෙක අතර සීමාවන් බොඳ කරයි. පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත වඩාත් ම මෑතකාලීන නීතිය වන බැවින් වඩාත් අදාළ වන්නේ එය බවට යමෙකුට තර්ක කළ හැකි අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති තොරතුරු දැනගැනීමේ අයිතිය ක්‍රියාත්මක කරන බැවින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත අනෙක් නීති අභිභවා බලපැවැත්විය යුතුය යන තර්කයද තවකෙකුට මතු කළ හැක.

මෙවැනි ගැටීම් ඇති අවස්ථාවලදී, 'Generalia specialibus non derogant' යන ලතින් ආප්තෝපදේශය නීතිය අර්ථ නිරූපණය කිරීම සඳහා භාවිතා කරනු ලැබේ. ගැටීම් තිබෙන්නේ යැයි පැහැදිලිව පෙනෙන්නට තිබෙන නීති දෙකක් අර්ථ නිරූපණය කිරීමේදී සාමාන්‍ය නීතියක විධිවිධාන විශේෂ නීතියක විධිවිධාන වලට යටත් විය යුතු බව එයින් අදහස් කෙරෙයි. කෙසේ වෙතත්, සාමාන්‍ය නීතිය කුමක් ද සහ විශේෂ නීතිය කුමක්ද යන්න නිර්වචනය කිරීම සැමවිටම පහසු නොවේ.[2]

### 5.1.3. ප්‍රායෝගික ඇඟවීම්

නීති දෙක අතර ඇති මෙම ගැටීම් වලින් මෙම කාරණයට අදාළ වන ප්‍රශ්න කිහිපයක් පැන නගියි. උදාහරණයක් ලෙස, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම සම්බන්ධ අයදුම්පතක් රාජ්‍ය නිලධාරියෙකුගේ ගමන්බිමන් හෝ වැටුප් විස්තර වැනි පුද්ගලික තොරතුරුවලට අදාළ වන්නේ නම්, පාලක නිලධාරීන් විසින් අදාළ කරගනු ලැබිය යුතු පරාමිතීන් මොනවාද? එසේත් නැතිනම්, පනත් දෙක ම සම්බන්ධයෙන් ගම්‍යමානයන් ඇති කළ හැකි කරුණු පිළිබඳව තීරණය කිරීම සඳහා සාමූහික තීරණ ගැනීමේ යාන්ත්‍රණයක් තිබිය යුතුද?

වෙනත් අධිකරණ බලයන් දෙස බැලීමෙන් මේ සඳහා විසඳුම් සෙවීමේ ක්‍රම පිළිබඳ අවබෝධයක් ලබා ගත හැක. උදාහරණ ලෙස, 2023 අංක 22 දරන ඉන්දියාවේ ඩිජිටල් පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත මගින් "පෞද්ගලික තොරතුරු වලට අදාළ තොරතුරු" යනුවෙන් සරලව අදහස් වනු පිණිස ඉන්දියාවේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 8(1)(ජී) වගන්තිය සංශෝධනය කර ඇත (තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පදනම, 2023). එයට පෙර, පෞද්ගලික තොරතුරු වෙත ප්‍රවේශය

2. සාමාන්‍ය නීතිය කුමක්ද සහ විශේෂ නීතිය කුමක්ද යන ප්‍රශ්නය සැලකීමේ දී, ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය වෙනුවෙන් සිදු කරන ලද අධ්‍යයනයක දී අශ්වින් නටේසන් ඉන්දියාවේ නඩුතීන්දුවක් උපුටා දක්වයි: අදාළත්වය සම්බන්ධයෙන් වූ ලයිෆ් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් එදිරි ඩී.ජේ. බහදූර් නඩුවේ දී, යම් නීතියක් සාමාන්‍ය නීතියක්ද, නැත හොත් විශේෂ නීතියක්ද යන්න තීරණය කිරීම සඳහා ප්‍රධාන විෂය කරුණ සහ දෘෂ්ටිකෝණය පිළිබඳව අවධානය යොමු කළ යුතු බව ඉන්දියාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය විය (නටේසන් 2023). ඇතැම් කාර්යයන් සඳහා, යම් පනතක් සාමාන්‍ය නීතිය විය හැකි අතර තවත් ඇතැම් කාර්යයන් සඳහා එය විශේෂ නීතිය විය හැක.

ප්‍රතික්ෂේප කිරීම, එම තොරතුරු පොදු ක්‍රියාකාරකම් වලට හෝ මහජන සුභසිද්ධියට සම්බන්ධයක් නොමැති අවස්ථාවන්ට, නැත හොත්, එය හෙළිදරව් කිරීම අනවශ්‍ය ලෙස පෞද්ගලිකත්වය ආක්‍රමණය කිරීමකට හේතු වන අවස්ථාවන්ට සීමා විය. ඩිජිටල් පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත මගින් සිදු කරන ලද මෙම පුළුල් සංශෝධනය මගින් පුද්ගලයෙකුට අදාළ ඕනෑම තොරතුරක් වෙත ප්‍රවේශය ප්‍රතික්ෂේප කිරීම සඳහා නීතිමය පදනමක් සාදා ගැනීමට ඉඩ ඇත. මෙම සංශෝධනය විවිධ පාර්ශ්වකරුවන්ගේ සැලකිය යුතු විවේචනවලට තුඩු දී ඇත. ශ්‍රී ලංකාවේ පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතෙහි නිදහස් කිරීමේ විධිවිධානයක් ඇතුළත් වන නමුත්, එය පුද්ගලික දත්ත ආරක්ෂා කිරීම සහ තොරතුරු දැනග ැනීමේ අයිතිවාසිකම අතර ගැටීම් සහ අවිනිශ්චිතතාවයන් සඳහා ඉඩකඩ විවෘතව තබයි. කෙසේ වෙතත්, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම මගින් යම් පෞද්ගලික දත්තයක් වෙත ප්‍රවේශ වීම සෘජුව ම සහ පුළුල්ව සීමා කරනවා වෙනුවට, පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත සමග අන්තර් සම්බන්ධය තුළින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීති තන්ත්‍රය ගොඩනැගීමට ශ්‍රී ලංකාවේ ප්‍රවේශය උපකාරී වෙයි.

පවතින ගැටීම් සහිත තත්ත්වය මගින් ඉදිරි මාර්ග දෙකක් පෙන්වා දෙයි. පළමු මාර්ගය ලෙස, අනාගතයේ දී මෙම ගැටීම් අනුව මෙම නීති දෙකට එකිනෙකෙහි සීමා සලකුණු කර ගත හැක. හුදෙක් නීති අර්ථ දැක්වීම් කෙරෙහි බලා නොසිට, එක් එක් සිද්ධියෙහි හරයන් පදනම් කරගෙන මහජන සුභසිද්ධිය පිළිබඳව වන අනෙකුත් පරීක්ෂණ යොදා ගැනීම මගින් විසඳුම් ලබා ගැනීම දෙවන මාර්ගය වේ. ඉහළ ම ආයතන දෙකට ප්‍රගාමීව තේමාව සකස් කර ගැනීම සඳහා එකට එක්ව කටයුතු කිරීමේ හැකියාව තිබෙන බැවින් දෙවන මාර්ගය වඩාත් යෝග්‍ය විය හැක.

## 5.2 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත - 1 වෙනි කාණ්ඩයේ ගැටීම

### 5.2.1. රහස්‍යභාවය සහ විනිවිදභාවය

නව දූෂණ විරෝධී පනත දූෂණය මැඩපැවැත්වීමේ ප්‍රගතිශීලී පියවරක් ලෙස හඳුන්වා දුන් විට බොහෝ පාර්ශව එය සතුටින් පිළිගත්හ. දූෂණයට එරෙහිව සටන් කිරීමේ සැබෑ වැඩිදියුණුවක් අත්කර ගැනීම සඳහා සහ ප්‍රතිසංස්කරණ සඳහා ගම්‍යතාවයක් ගොඩනැගීමට එයට ඇති හැකියාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ රාජ්‍යකරණ විශ්ලේෂණ වාර්තාවද (ජා.මූ.අ.,2023) ප්‍රශංසාවට ලක් කළේය. මෙම පනත යටතේ පිහිටුවා ඇති අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ස්වාධීන කොමිෂන් සභාවක් වුවද, එය පොලිස් දෙපාර්තමේන්තුවේ කාර්යභාරයට (එහි විමර්ශනවලට) සහ නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්යභාරයට (එහි නඩු පැවරීමේ කාර්ය භාරයට) බොහෝ සෙයින් සමාන කාර්ය භාරයක් ඉටු කරයි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාවේ මෙම කාර්යභාරය සැලකිල්ලට ගැනීමේ දී, එම ආයතනය විසින් අවසන් නොකළ විමර්ශනවලට අදාළ ඇතැම් අතිශය වැදගත් තොරතුරුවල රහස්‍යභාවය සහතික කළ යුතු වේ. තොරතුරුවල විනිවිදභාවය සඳහා ඇති ඉල්ලුම රහස්‍යභාවය පිළිබඳ විධිවිධාන අවශ්‍ය කරන විස්තරවලට වඩා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාවේ කාර්යක්ෂමතාවයට බොහෝ දුරට සම්බන්ධ වන ඒවාට වේ. එවැනි තොරතුරු රහස්‍ය තොරතුරු ලෙස ප්‍රකාශයට පත් කිරීමට අවස්ථාව ලබාදීමෙන් දූෂණ විරෝධී පනත අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාව වෙත පුළුල් ආවරණයක් සපයයි.

### 5.2.2. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම සහ දූෂණ විරෝධී පනත අතර ගැටීම්

දූෂණ විරෝධී පනතෙහි 161 වෙනි වගන්තිය තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීති තන්ත්‍රය සමග 1 වෙනි කාණ්ඩය ලෙස වර්ග කර ඇති සෘජු ගැටීමක් නිර්මාණය කරමින් අනෙකුත් පනත් අභිබවා එම පනතෙහි විධිවිධාන බලපැවැත්වෙන සීමා රහිත බලපෑමක් ඇති කරයි. එසේ වුවද, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීතිය මගින් අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම ක්‍රියාත්මක කරයි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාව පිහිටුවීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XXIX පරිච්ඡේදය මගින් නිර්වචනය කර ඇති නමුත්, දූෂණ විරෝධී පනත සෘජුව ම තනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය විධිවිධානයකින් ව්‍යුත්පන්න නොකෙරෙන අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මෙහෙයවීමේ මූලධර්ම යටතේ 27(2)(ආ) වගන්තියේ දක්වා ඇති පරිදි ජනතාවගේ සමස්ත සුභසිද්ධියට දායක වෙයි.

දූෂණ විරෝධී පනතේ 28 වෙනි වගන්තිය මගින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාවේ කොමසාරිස්වරුන් සහ අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු සියලු ම නිලධාරීන්ට රහසිගතභාවය සම්බන්ධ ශක්තිමත් ආරක්ෂාවක් සපයයි. එම වගන්තිය මෙසේ ය:

> (1) කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු, අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ යම් සේවානියුක්තයකු හෝ 27 වන වගන්තිය යටතේ සේවා ලබා ගනු ලැබ සිටින වෙනත් යම් තැනැත්තකු විසින්, මේ පනතේ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්ය සඳහා හෝ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා මේ පනත යටතේ යම් විධිවිධානයක් සාදනු ලැබ ඇති අවස්ථාවක දී මිස, මේ පනත යටතේ වූ ස්වකීය බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී තමාට ලැබුණු හෝ තමා විසින් දැනුවත් වූ යම් තොරතුරු හෙළිදරව් කරනු නොලැබිය යුතුය.

මෙම විධිවිධානය ද තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම සමග ගැටීමක් තිබූ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතෙන් (1994 අංක 19 දරන) ව්‍යුත්පන්න වී තිබෙන බව විශේෂයෙන් සඳහන් කළ යුතු වේ. වර්තමාන දූෂණ විරෝධී පනතේ 3 වෙනි උපවගන්තිය මගින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීතියට අනුගත වීම සඳහා මෙම රහසිගතභාවය පිළිබඳ විධිවිධානය පහත සාකච්ඡා කර ඇති පරිදි සීමා කර ඇත. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිගනිමින්, 28(3) වගන්තියේ තවදුරටත් සඳහන් කරන්නේ, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්:

> ... 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උපවගන්තියේ විධිවිධානවලට යටත් ව සහ කොමිෂන් සභාවේ අවසරය ඇතිව, පොදු මහජන යහපත වෙනුවෙන් අවශ්‍ය බවට කොමිෂන් සභාව විසින් සලකන යම් තොරතුරු, මහජනතාව කෙරෙහි වූ කොමිෂන් සභාවේ වූ විනිවිදභාවය සහ වගකීම පිළිබඳ කාර්ය සඳහා මුද්‍රිත මාධ්‍යයේ, ජනමාධ්‍යයේ හෝ සමාජ මාධ්‍යයේ පළ කිරීමේ කාර්ය සඳහා හෙළිදරව් කරනු ලැබිය හැකි ය.

දූෂණ විරෝධී පනතෙහි කෙටුම්පත්කරුවන් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීති තන්ත්‍රය සලකා බලා ඇති අතර, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5(1) වෙනි වගන්තිය අනුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාව වෙත ප්‍රමාණවත් ආරක්ෂාවක් ලබා දී ඇත.

### 5.2.3. ප්‍රායෝගික සහ සංකල්පීය ඇඟවීම්

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන නියෝග, මෙම නීති තන්ත්‍ර දෙක අන්තර් සම්බන්ධිත වීමේදී ඒවායෙහි ක්‍රියාත්මකවීම පිළිබඳ අවබෝධ කර ගැනීමට අවශ්‍ය සන්දර්භය සපයා දෙයි. වර්තමාන දූෂණ විරෝධී පනත යටතේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාව විසින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ හෙළිදරව් කිරීම්වලට එරෙහිව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ අභියාචනා මගින් කිසිදු නියෝගයක් ලබා දී නැත. යම් තොරතුරක් හෙළි කිරීම තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5(1) වෙනි වගන්තිය උල්ලංඝනය කිරීමක් නොවන්නේ යැයි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාව සලකන්නේ නම්, එම තොරතුරු හෙළි කරන ලෙස අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාවට නියම කරමින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 558/2018 නියෝගය මගින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවෙහි ප්‍රවේශය පැහැදිලි වෙයි.

මෙම නීති තන්ත්‍ර අතර පවතින මෙහෙයුම් ගැටීම් පහසුවෙන් සමනය කළ නොහැක. විනිසුරු සම්පත් බී. අබයකෝන් සහ විනිසුරු පී. කුමාරරත්නම් විසින් ලබා දෙන ලද CA/RTI/0004/2021 දරන අභියාචනාධිකරණ තීන්දුවෙන් මේ සම්බන්ධ සියුම් අවබෝධයන් ලබා ගත හැක. මෙම තීන්දුවේදී, 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ හෙළිදරව් නොකිරීමේ විධිවිධානය යටතේ ආවරණය ඇති බව සඳහන් කරමින් පාර්ලිමේන්තුවේ තොරතුරු නිලධාරියා විසින් තොරතුරු දැනගැනීමේ පනත යටතේ වන නියෝග යක් ප්‍රතික්ෂේප කළ විට, විනිසුරුවරු එම නීති දෙකෙහි අභිප්‍රායයන්හි සමානත්වයන් අවබෝධ කර ගැනීම සඳහා එම පනත් දෙකෙහි අරමුණු සංසන්දනය කළහ. මෙම පනත් දෙකට ම, බලාත්මක කිරීමට අදාළව වසර 40 ක කාල පරතරයක් තිබුණ ද, රජයේ සහ රාජ්‍ය නිලධාරීන්ගේ වගවීම සහ විනිවිදභාවය වැඩි කිරීමේ පොදු අරමුණක් තිබේ.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත සහ දූෂණ විරෝධී පනත අතර ගැටීම විසඳීම සඳහා, පනත් දෙකෙහි පූර්විකාවන් සංසන්දනය කිරීම වැදගත් වේ:

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ පූර්විකාව මෙසේ ය:

> දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියේ ඇතැම් විධිවිධාන සහ වෙනත් ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සම්මතයන්, ප්‍රමිති සහ ප්‍රශස්ත පරිචයන් බලාත්මක කිරීම සඳහා ද; වත්කම් සහ බැරකම් ප්‍රකාශවලට අදාළ වැරදි සහ අල්ලස්, දූෂණ පිළිබඳ චෝදනා සහ ආශ්‍රිත වැරදි අනාවරණය සහ විමර්ශනය කිරීමට සහ වත්කම් සහ බැරකම් ප්‍රකාශවලට අදාළ වැරදි, අල්ලස්, දූෂණ වැරදි සහ ආශ්‍රිත වැරදි සඳහා නඩු පැවරීමට විධාන කිරීමට සහ නඩු පැවරීමට ස්වාධීන කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; දූෂණ ක්‍රියා වැළැක්වීම ප්‍රවර්ධනය ඉහළ නැංවීම සඳහා ද; දූෂණයට එරෙහිව සටන් කිරීම සඳහා මහජනතාව දැනුවත් කිරීම සහ මහජනතාව අතර දැනුවත් බව ඉහළ නැංවීම සඳහා ද; (26 වන අධිකාරය වූ) අල්ලස් පනත, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීමේ පනත පරිච්ඡින්න කිරීමට සහ ඒ හා සම්බන්ධ හෝ එයට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

තොරතුරු දැනගැනීමේ පනතේ පූර්විකාව මෙසේය.

> තොරතුරුවලට ප්‍රවේශවීමට ඇති අයිතිවාසිකම සම්බන්ධයෙන් විධිවිධාන සැලසීම සඳහා ද, තොරතුරු වෙත ප්‍රවේශ වීම ප්‍රතික්ෂේප කළ හැකි හේතු නිශ්චිතව දැක්වීම සඳහා ද, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව පිහිටුවීම සඳහා ද, තොරතුරු නිලධරයන් පත් කිරීම සඳහා ද; තොරතුරු ලබා ගැනීම සඳහා වන ක්‍රියාපටිපාටිය නිශ්චිතව දැක්වීම සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැළසීම පිණිස ද වූ පනතකි.
>
> ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(අ) ව්‍යවස්ථාව මගින් තොරතුරු සඳහා ප්‍රවේශ වීමේ අයිතිය තහවුරු කර ඇති බැවින්, සහ තොරතුරු ලබා ගැනීමේ අයිතිවාසිකම බලාත්මක කිරීම මගින් පොදු අධිකාරිවල විනිවිදභාවය සහ වගකීම පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කිරීමේ අවශ්‍යතාවක් පැන නැගී ඇති බැවින් ද, එමගින් ශ්‍රී ලංකාවේ මහජනතාවට යහපාලනය සඳහා වැඩි වශයෙන් සහභාගි විය හැකි සහ රටේ පොදු ජන ජීවිතයේ දී සක්‍රීය ලෙස සහභාගි විය හැකි සමාජයක් ප්‍රවර්ධනය වන බැවින් ද;

මෙම නීති දෙකෙන් ම ආණ්ඩුවේ විනිවිදභාවය සහ වගවීම පිළිබඳ විශ්වීය වශයෙන් පිළිගත් සම්මතයන් ආරක්ෂා කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමටත්, දූෂණයට ඇති අවස්ථා අවම කිරීමටත් අපේක්ෂා කරන බව පැහැදිලි ය. මෙම අර්ථයෙන් ගත් කල, මෙම නීති දෙකෙහි පෙනෙන්නට තිබෙන මෙහෙයුම් ගැටීම් මෙම නීති එකට එක්ව ක්‍රියාකිරීමේ අරමුණුවලට වඩා අඩු වැදගත්කමකින් යුතු බව පැහැදිලි වෙයි. මෙමගින් මහජන සුභසිද්ධිය පිළිබඳ පරීක්ෂණ වැනි අන්‍යෝන්‍ය වශයෙන් නම්‍ය විය හැකි කාර්ය රාමු පදනම් කරගත් සහයෝගී ප්‍රවේශයන් වලට ඉඩ සලසයි.

## 5.3 2024 අංක 09 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත - 1 වෙනි කාණ්ඩයේ ගැටීම

### 5.3.1. දුස්සන්ධානීය ප්‍රවේශය

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනතේ 51 වෙනි වගන්තිය මගින් අනෙකුත් නීති අභිබවා යන බලතල ලබා දෙන විධිවිධාන සලසන අතර, එම වගන්තියේ පහත සඳහන් පරිදි දක්වා ඇත: “මේ පනතේ විධිවිධාන සහ වෙනත් ලිඛිත නීතියක් අතර අනනුකූලතාවයක් හෝ ගැටීමක් ඇති වුවහොත්, එවිට, මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.” තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත බලාත්මක කිරීමෙන් පසුව මෙම පනත සම්මත කර ඇති බව සැලකිල්ලට ගැනීමේ දී, මෙම පනත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති තොරතුරු වෙත ප්‍රවේශ වීමේ අයිතිය අභිබවා යන්නේද යන තර්කය මතු වේ.

මෙම නීතිය කෙටුම්පත් කළ අය මෙම නීතිය තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීති තන්ත්‍රයට සම්බන්ධ වන්නේ කෙසේද යන්න පිළිබඳව අවධානය යොමු කර නොතිබීම මෙම ගැටළු තව දුරටත් සංකීර්ණ කර ඇත. මෙම පනත හඳුන්වා දෙනු ලැබුවේ ශ්‍රී ලංකාවේ ප්‍රකාශනයේ නිදහසට එමගින් එල්ල කරනු ලැබිය හැකි අභියෝග පෙන්වා දෙමින් සිවිල් සමාජයෙන් එල්ලවූ දැඩි විරෝධතා සහ ජාත්‍යන්තර ප්‍රජාව විසින් මතු කරන ලද අප්‍රසාදය මධ්‍යයෙහි ය.

### 5.3.2. විනිවිදභාවය පිළිබඳ ඇඟවීම්

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනතේ ඇති බැහැර කිරීමේ ස්වභාවය අනුව, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීති තන්ත්‍රය සහ මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත අතර ඇති විය හැකි ගැටීම් විසඳීම සඳහා වන ඉදිරි මග දුස්සන්ධානීය විය හැක. උදාහරණයක් ලෙස, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ කොමිෂන් සභාව විසින් අවහිර කරනු ලබන විශේෂිත මාර්ගගත පළ කිරීම් හෝ ගිණුම් අනාවරණය කිරීමට එම කොමිෂන් සභාව මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත මගින් බැඳී නැත. කොමිෂන් සභාව විෂය භාර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලබන ස්වකීය වාර්ෂික වාර්තාව මගින්, ඔවුන් පැමිණිලි කර ඇති හෝ ඉවත් කර ඇති මාර්ගගත අන්තර්ගතයන් හෝ ස්ථාන පිළිබඳව හඳුනාගත හැකි තොරතුරු සැපයීම අවශ්‍ය නොවේ. පාර්ලිමේන්තුවට එම දත්ත ලබා ගැනීමට අවශ්‍ය වුවද, ඒ සඳහා වන ක්‍රියාවලිය ඉතා දීර්ඝ වන අතර, මහජනතාවට එම තොරතුරු වෙත ප්‍රවේශ විය නොහැක. මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනතේ 24 වෙනි වගන්තිය මගින් ඕනෑම මහේස්ත්‍රාත් අධිකරණයකට මාර්ගගත අන්තර්ගතයන් සංසරණය වීම නැවැත්වීමට නියෝග නිකුත් කිරීමට බලය පැවරෙන විධිවිධාන සලසා ඇත. එබැවින්, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ කොමිෂන් සභාව සහයෝගී නොවන ප්‍රවේශයක් අනුගමනය කිරීමට තීරණය කළ මාර්ගගත අන්තර්ගතයන් නියාමනය කරන ආකාරය නිරීක්ෂණය කිරීම අපහසු වනු ඇත. මෙම කොමිෂන් සභාව විනිවිදභාවයෙන් යුතු යාන්ත්‍රණ සහ ප්‍රගාමී හෙළිදරව් කිරීම් අනුගමනය නොකරන්නේ නම්, ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීති තන්ත්‍රයට සහ ප්‍රකාශනයේ නිදහසට බරපතල තර්ජනයක් එල්ල කිරීමේ විභවයක් එම කොමිෂන් සභාවට ඇත.

### 5.4 2023 අංක 10 දරන අපරාධයක වින්දිතයින් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත - 3 කාණ්ඩයේ ගැටීම

මෙම පනත ශ්‍රී ලංකාවේ යුක්තිය සහ වගවීම පිළිබඳ නීති රාමුවේ ඉතා වැදගත් නීතියක් වේ. මෙම පනතේ 96 වැනි වගන්තිය මගින් පනතේ විධිවිධාන ක්‍රියාත්මක කරන නිලධාරීන් සතුව ඇති දත්තවල රහස්‍යභාවය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි විධිවිධාන සලසා ඇත:

> (1) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට බලාත්මකභාවයක් දීමේ කාර්යය සඳහා අවශ්‍ය වන්නේ නම් මිස, යම් නඩු කටයුත්තක දී, අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු මේ පනත යටතේ සහාය හෝ ආරක්ෂාව ලබන්නේ ද යන්න හෝ ලබා ඇත්තේ ද යන්න හෙළි දරව් කිරීමට කිසිදු තැනැත්තකුට බලපෑමක් නොකරනු ලැබිය යුතු ය.

මෙම තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීතිය පටු ලෙස අර්ථකථනය නොකරන තාක් කල් එම නීතිය සමග ගැටෙන්නේ නැත. කෙසේ වෙතත්, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීති තන්ත්‍රය ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා, සුළු හෝ ගැටීම් තිබේ නම් ඒවා විභව්‍ය ගැටීම් ලෙස සලකනු ලැබේ. මෙම නීති අතර තිබිය හැකි යම් වෙනස්කම් පූර්වයෙන් ඉවත් කිරීම සඳහා, අදාළ ආයතන අතර සංවාදයක් ගොඩනැගිය හැක. අනෙක් මාර්ගය වන්නේ අදාළ පොදු අධිකාරිය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ අයදුම්පතක් ප්‍රතික්ෂේප වූ අවස්ථාවක, තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම සම්බන්ධ අභියාචනා බලාපොරොත්තුවෙන් සිටීම වන අතර, එහිදී තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව විසින් නියෝගයක් නිකුත් කරනු ඇත.

## 6. සමාප්තිය

මෙම විශ්ලේෂණය මගින් ප්‍රජාතන්ත්‍රවාදය, විනිවිදභාවය සහ පෞද්ගලිකත්වය කෙරෙහි ශ්‍රී ලංකාවේ විවිධ නීතිවල ඇති ගම්‍යමානයන් පිළිබඳ ඇගයීමක් කරමින්, එම නීති සහ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත අතර ඇති විය හැකි ගැටීම් පිළිබඳව ගැඹුරින් විමසා බලයි. විශේෂයෙන් ම, පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත, දූෂණ-විරෝධී පනත සහ මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත යන පනත්වල ඇති අනෙකුත් නීති අභිබවා යන විධිවිධාන හේතුවෙන් ඒවා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීති තන්ත්‍රයට 1 වන කාණ්ඩයේ ගැටීම් ලෙස වර්ගීකරණය කර ඇති සෘජු අභියෝග එල්ල කරයි. එයට සාපේක්ෂව, අපරාධයක වින්දිතයින් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත මගින් විභව්‍ය, එහෙත් සෘජුභාවයෙන් අඩු, 3 වන කාණ්ඩය යටතේ වර්ගීකරණය කර ඇති ගැටුම් ඇති විය හැකි බව පෙන්නුම් කරයි.

2022 වර්ෂයේ සිට සම්මත කර ඇති සියලු ම නීති අධ්‍යයනය කර බැලීමේ දී, ඒ අතරින් බොහොමයක් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීති තන්ත්‍රයට අනුකූල වන බව නිරීක්ෂණය වේ. ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ලබා දී ඇති පොරොන්දුවලට අනුකූල වන පරිදි කෙටුම්පත් කර ඇති ඇතැම් නව පනත්වල විශේෂ ප්‍රගතියක් නිරීක්ෂණය කළ හැක. මෙම නීති තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීති තන්ත්‍රයට සම්බන්ධ වන ආකාරය ඒවායෙහි පැහැදිලිව ම සඳහන් කර ඇත. පවතින නීතිවලට සංශෝධන සිදු කරන විට, ඒවා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතට සම්බන්ධ වන්නේ කෙසේද යන්න අර්ථ නිරූපණය කරන වගන්තියක් එකතු කිරීමට අවස්ථාවක් තිබේ. එහෙත් අධ්‍යයනය කරන ලද කිසිම සංශෝධනයක එසේ සිදු කර නැත. මෙම නොකර හැරීම මඟහැරී ගිය අවස්ථාවක් ලෙස සැලකිය හැකිය.

පුද්ගලයන්ගේ පෞද්ගලිකත්වයට ගරු කරමින් ආණ්ඩුකරණයේ විනිවිදභාවයට ප්‍රමුඛත්වය දෙන අධිකරණමය අර්ථ දැක්වීම් සහ ව්‍යවස්ථාපිත විධිවිධාන මගින් අවධාරණය කර ඇති පරිදි, පෞද්ගලිකත්වය සහතික කිරීම සහ තොරතුරු වෙත මහජන ප්‍රවේශය පවත්වාගෙන යාම අතර සියුම් සමතුලිතතාවයක් තිබීම අවශ්‍ය වේ. මෙම මූලධර්මයට පටහැනි විය හැකි නව නීති තිබුණද, විනිවිදභාවය තහවුරු කිරීමේ ව්‍යවස්ථාදායක අභිප්‍රායයක් තිබෙන බව පෙන්නුම් කරමින්, මහජන සුභසිද්ධිය පිළිබඳ කරුණු සම්බන්ධයෙන් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ උත්තරීතරභාවය නීති කිහිපයක් මගින් තහවුරු කර ඇත. ඉදිරියේ දී මෙම ගැටුම් නිරාකරණය කිරීම පිණිස විනිවිදභාවය, වගවීම සහ පෞද්ගලිකත්වය යන මූලධර්මවලට අනුකූල වන සූක්ෂ්ම අර්ථනිරූපණ සහ ප්‍රගාමී නෛතික රාමු අවශ්‍ය වේ. මෙම ප්‍රවේශය මගින් ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ශක්තිමත් කරනවා පමණක් නොව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි දක්වා ඇති මූලික අයිතිවාසිකම් ද ආරක්ෂා කරනු ඇත.

## 7. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීති තන්ත්‍රයට බලපාන නීති ප්‍රතිසංස්කරණ සඳහා නිර්දේශ

ඉදිරි මාර්ගයක් ලෙස නිර්දේශ කිහිපයක් ඉදිරිපත් කරනු ලැබේ. මෙම නිර්දේශ ඉදිරිපත් කරනු ලබන්නේ පාර්ශ්වකාර ආයතනවල අදහස් විමසීමකින් තොරව වන බැවින්, ඒවා ක්‍රියාත්මක කිරීමට පෙර එම ආයතනවල අදහස් විමසීමට අවශ්‍ය විය හැක.

**<u>රාජ්‍ය ආයතන</u>**

1. මහජන සුභසිද්ධියට අයත් වන අංග මොනවාද යන්න නිර්වචනය කිරීම සඳහා අදාළ තැන්හි දී පොදු අධිකාරීන් සඳහා මහජන සුභසිද්ධිය පිළිබඳ පරීක්ෂණ සකස් කිරීම වැදගත් අයිතිවාසිකම් ආරක්ෂා කරනු ඇතැයි සහ ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදයක වැදගත් කාර්යයන් ඉටු කරනු ඇතැයි අපේක්ෂා කරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත සහ දූෂණ විරෝධී පනත සඳහා මෙය විශේෂයෙන් අදාළ වේ.

2. මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනතෙහි ඇති අපැහැදිලිබව අවම කරනු පිණිස තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීති තන්ත්‍රය එයට ඇතුළත් කිරීම සඳහා මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත සංශෝධනය කිරීම.

3. සියලු ම අනාගත නීති සංශෝධන වලට තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ වගන්තියක් අන්තර්ගත කිරීම.

**සිවිල් සමාජය**

4. අනාගත සංශෝධන මගින් වර්තමානයේ පවතින අඩුපාඩු ආමන්ත්‍රණය කිරීමට හැකි වන පරිදි, පවතින අඩුපාඩු සහ ගැටීම් ඉවත් කිරීම වෙනුවෙන් උද්දේශනය කිරීම.

5. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීති තන්ත්‍රය වැඩිදියුණු කිරීමට මග පාදනු පිණිස, ආයතනවලට ඒ පිළිබඳව කටයුතු කිරීමට බල කිරීම සඳහා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ ඉල්ලීම් ඒකරාශි කිරීමට හැකි වන පරිදි තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීති තන්ත්‍රයට අදාළව දැනට පවතින නීතිවල තිබෙන අඩුපාඩු පිළිබඳව දැනුවත්භාවය ඇති කිරීම.

## 8. ආශ්‍රිත ලේඛන


ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (2023), "ශ්‍රී ලංකාව: තාක්ෂණික සහාය වාර්තාව - ආණ්ඩුකරණ විශ්ලේෂණ ඇගයීම," ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, සැප්තැම්බර් 30, https://www.elibrary.imf.org/view/journals/002/2023/340/article-A001-en.xml.

නටේසන්, අශ්විනි (2023), "'කඹය මත ඇවිදීම' ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම සහ පුද්ගලික දත්ත ආරක්ෂා කිරීම", ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, "පනත් සහ පනත් කෙටුම්පත්," https://www.parliament.lk/business-of-parliament/acts-bills?view=actsandbills.

ඉන්දියාවේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පදනම, "තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 8(2) වෙනි වගන්තියට ඩිජිටල් පුද්ගලික දත්ත ආරක්ෂණ පනතේ 44(3) වෙනි වගන්තිය අභිබවා යා හැකිද?", 2023 අගෝස්තු 14, https://www.rtifoundationofindia.com/can-section-82-rti-act-overcome-section-443-dpdp-a.

කැනඩාවේ ශ්‍රේෂ්ඨාධිකරණය, "කැනඩාවේ ශ්‍රේෂ්ඨාධිකරණය - බෙවර්ලි මැක්ලච්ලින් විසින් පවත්වන ලද කථාව - කැනේඩියානු ප්‍රජාතන්ත්‍රවාදයේ තොරතුරු වෙත ප්‍රවේශය සහ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම," 2009 නොවැම්බර් 3, ප්‍රවේශ වූ දිනය: 2023 අගෝස්තු 2.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (2018), "තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීති තන්ත්‍රය සමග නීති සම්පාදනයන්හි අනුකූලත්වය සමාලෝචනය කිරීම," https://www.undp.org/sites/g/files/zskgke326/files/migration/lk/UNDPLKA---Review-of-Sri-Lankas-RTI-Regime.pdf.

# ඇමුණුම

1 වෙනි වගුව: 2022 ජනවාරි මාසයේ සිට 2024 මැයි මාසය දක්වා සම්මත කර ගන්නා ලද සියලු ම නීති විශ්ලේෂණය කර සකස් කරන ලද, ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීති තන්ත්‍රය කෙරෙහි බලපෑමක් ඇති කරන නීති ලැයිස්තුවක්.

| අනු අංකය | පනතේ නම | ගැටුමේ කාණ්ඩය | වගන්ති |
|---|---|---|---|
| 2022 වර්ෂය | | | |
| 1 | 2022 අංක 1 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 2 | අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 3 | 2022 අංක 3 දරන පුද්ගලනාශක බිම්බෝම්බ තහනම් කිරීම පනත | ගැටීමක් නැත | |
| 4 | 2022 අංක 4 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 5 | සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 6 | 2022 අංක 6 දරන පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීමේ) (සංශෝධන) පනත, | ගැටීමක් නැත | |
| 7 | 2022 අංක 7 දරන වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන) පනත, | ගැටීමක් නැත | |
| 8 | 2022 අංක 8 දරන බුද්ධිමය දේපළ (සංශෝධන) පනත | ගැටීමක් නැත | |

| අනු අංකය | පනතේ නම | ගැටුමේ කාණ්ඩය | වගන්ති |
|---|---|---|---|
| 9 | 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත | (1) වෙනි කාණ්ඩය | 3. (1) දත්ත දායකයන්ගේ පෞද්ගලික දත්ත ආරක්ෂා කිරීමට අදාළව වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, එය නොතකා, මේ පනතේ විධිවිධාන බලාත්මක විය යුතු ය; එසේ වුව ද, පොදු අධිකාරියක් වෙනත් යම් ලිඛිත නීතියක් මගින් පාලනය වන අවස්ථාවක, මේ පනත සමග අනුකූලවනතාක් දුරට, එකී අධිකාරිය විසින් දත්ත දායකයන්ගේ පෞද්ගලික දත්ත එකී ලිඛිත නීතියේ විධිවිධානවලට අනුකූලව සැකසීම නීත්‍යනුකූල විය යුතු ය.<br><br>(2) මේ පනතේ විධිවිධාන සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන අතර යම් අනනුකූලතාවක් ඇති අවස්ථාවක, මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.<br><br>40. මේ පනතේ විධිවිධාන සඳහා වන යම් නිදහස් කිරීමක්, සීමා කිරීමක් හෝ බලහීන කිරීමක් සඳහා එකී නිදහස් කිරීම, සීමා කිරීම හෝ බලහීන කිරීම යම් නීතියක් මගින් විධිවිධාන සලසනු ලබන අවස්ථාවක සහ මූලික අයිතිවාසිකම් සහ නිදහස යනාදියෙහි හරයට ගරු කිරීම සඳහා සහ -<br><br>(අ) ශ්‍රී ලංකා ජනරජයේ ජාතික ආරක්ෂාව, ආරක්ෂණය, මහජන සුරක්ෂිතතාව, මහජන සෞඛ්‍යය, ආර්ථික සහ මූල්‍ය ක්‍රමවල ස්ථිරතාව ආරක්ෂා කිරීම;<br><br>(ආ) අධිකරණයේ අපක්ෂපාතිත්වය සහ ස්වාධීනත්වය;<br><br>(ඇ) අපරාධ වැරදි වැළැක්වීම, විමර්ශනය කිරීම හෝ නඩු පැවරීම;<br><br>(ඈ) අපරාධ දඬුවම් ක්‍රියාත්මක කිරීම; සහ<br><br>(ඉ) විශේෂයෙන් අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ තොරතුරු දැන ගැනීමේ අයිතීන් ඇතුළුව සහ තැනැත්තන්ගේ මූලික නිදහස සහ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම,<br><br>සඳහා ප්‍රජාතාන්ත්‍රික සමාජයක් තුළ අවශ්‍ය සහ සමානුපාතික පියවර ගනු ලැබීම සඳහා හැර, එවැනි නිදහස් කිරීමකට, සීමා කිරීමකට හෝ බලහීන කිරීමකට ඉඩ ලබාදෙනු නොලැබිය යුතු ය. |
| 10 | 2022 අංක 10 දරන කම්කරු වන්දි (සංශෝධන) පනත | ගැටීමක් නැත | |

| අනු අංකය | පනතේ නම | ගැටුමේ කාණ්ඩය | වගන්ති |
|---|---|---|---|
| 11 | 2022 අංක 11 දරන ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 12 | 2022 අංක 12 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 13 | 2022 අංක 13 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | ප්‍රගතියක් නැත | එකතු කළ අගය මත බදු පනතේ (2002 අංක 14 දරන) 65 වෙනි සහ 73 වෙනි වගන්ති යටතේ වන රහස්‍යභාවය පිළිබඳ වගන්ති තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීති තන්ත්‍රය සමග 2 කාණ්ඩයේ ගැටුම් ඇති කරයි. |
| 14 | 2022 අංක 14 දරන අධිභාර බද්ද පනත | ගැටීමක් නැත | |
| 15 | 2022 අංක 15 දරන ශ්‍රී ශාක්‍යසිංහාරාම විහාරස්ථ කාර්යසාධක සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත | ගැටීමක් නැත | |
| 16 | 2022 අංක 16 දරන ශ්‍රී ලංකා විදුලි බල (සංශෝධන) පනත | ප්‍රගතියක් නැත | විදුලිබල ප්‍රතිසංස්කරණ පනතේ (2002 අංක 28 දරන) 64 වෙනි වගන්තිය යටතේ සහ ශ්‍රී ලංකා විදුලිබල පනතේ (2009 අංක 20) අංක (1) සමග 59(3), (4) සහ (5) වෙනි වගන්ති යටතේ තොරතුරු වාර්තා කිරීම පිළිබඳ විධිවිධාන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීති තන්ත්‍රය සමග 2 වන කාණ්ඩයේ ගැටීමක් ලෙස පවතියි. |
| 17 | 2022 අංක 17 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 18 | 2022 අංක 18 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 19 | 2022 අංක 19 දරන කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන) පනත | ගැටීමක් නැත | |
| 20 | 2024 අංක 20 දරන උකස් (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 21 | 2022 අංක 21 දරන විසර්ජන (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 22 | 2022 අංක 22 දරන කාර්මික ආරවුල් (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 23 | 2022 අංක 23 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත | ගැටීමක් නැත | |

| අනු අංකය | පනතේ නම | ගැටුමේ කාණ්ඩය | වගන්ති |
|---|---|---|---|
| 24 | 2022 අංක 24 දරන කාර්මික ආරවුල් (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 25 | 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත | ගැටීමක් නැත | |
| 26 | 2022 අංක 26 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 27 | 2022 අංක 27 දරන ඛනිජ තෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 28 | 2022 අංක 28 දරන ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 29 | 2022 අංක 29 දරන අන්තිම කැමැති පත්‍ර (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 30 | 2022 අංක 30 දරන වංචා වැළැක්වීමේ (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 31 | 2022 අංක 31 දරන නොතාරිස් (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 32 | 2022 අංක 32 දරන ලේඛන ලියාපදිංචි කිරීම (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 33 | 2022 අංක 33 දරන සුළු හිමිකම් අධිකරණ කාර්ය පටිපාටිය පනත | ගැටීමක් නැත | |
| 34 | 2022 අංක 34 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 35 | 2022 අංක 35 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 36 | 2022 අංක 36 දරන සිවිල් නඩුවිධාන සංග්‍රහය (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 37 | 2022 අංක 37 දරන උඩරට විවාහ සහ දික්කසාද (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 38 | 2022 අංක 38 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 39 | 2022 අංක 39 දරන ළමයින් සහ තරුණ තැනැත්තන් (සංශෝධන) පනත | ප්‍රගතියක් නැත | ළමයින් සහ තරුණ තරුණ තැනැත්තන් ආඥාපනත (1978 අංක 2 දරන) - පනතේ 11 වෙනි සහ 20 වෙනි වගන්ති මගින් 3 වෙනි කාණ්ඩයේ උල්ලංඝනය වීමක් සිදු වේ. |

| අනු අංකය | පනතේ නම | ගැටුමේ කාණ්ඩය | වගන්ති |
|---|---|---|---|
| 40 | 2022 අංක 40 දරන අන්තරායකර සත්ත්ව (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 41 | 2022 අංක 41 දරන විෂවර්ග, අබිං සහ අන්තරාදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 42 | 2022 අංක 42 දරන විසර්ජන (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 43 | 2022 අංක 43 දරන විසර්ජන පනත | ගැටීමක් නැත | |
| 44 | 2022 අංක 44 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | ප්‍රගතියක් නැත | එකතු කළ අගය මත බදු පනතේ (2002 අංක 14 දරන) 65 වෙනි සහ 73 වෙනි වගන්ති යටතේ වන රහස්‍යභාවය පිළිබඳ වගන්ති තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීති තන්ත්‍රය සමග තවදුරටත් 2 වෙනි කාණ්ඩයේ ගැටුම් ඇති කරයි. |
| 45 | 2022 අංක 45 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත | ප්‍රගතියක් නැත | දේශීය ආදායම් (සමාව දීම විධිමත් කිරීමේ) පනතේ (2004 අංක 10 දරන) 5 වෙනි වගන්තියේ රහස්‍යභාවය පිළිබඳ වගන්තිය, දේශීය ආදායම් පනතේ (2006 අංක 10 දරන) අංක 203 සිට 209 (1) - (13) දක්වා වන වගන්ති සහ දේශීය ආදායම් පනතේ (2000 අංක 38) දරන අංක 173 සහ 178(1) - (13) දරන වගන්ති වලින් පැන නගින 1 වෙනි කාණ්ඩයේ ගැටීම නොවෙනස්ව පවතියි. |

| අනු අංකය | පනතේ නම | ගැටුමේ කාණ්ඩය | වගන්ති |
|---|---|---|---|
| 2023 වර්ෂය | | | |
| 1 | 2023 අංක 1 දරන බද්දට දී ඇති පරිශ්‍රවල සන්තකය ආපසු ලබා ගැනීමේ පනත | ගැටීමක් නැත | |
| 2 | 2023 අංක 2 දරන පුනරුත්ථාපන කාර්යාංශය පනත | ගැටීමක් නැත | |
| 3 | 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත | ගැටීමක් නැත | |
| 4 | 2023 අංක 4 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත | ප්‍රගතියක් නැත | දේශීය ආදායම් (සමාව දීම විධිමත් කිරීමේ) පනතේ (2004 අංක 10 දරන) 5 වෙනි වගන්තියේ රහස්‍යභාවය පිළිබඳ වගන්තිය, දේශීය ආදායම් පනතේ (2006 අංක 10 දරන) අංක 203 සිට 209 (1) - (13) දක්වා වන වගන්ති සහ දේශීය ආදායම් පනතේ (2000 අංක 38) දරන අංක 173 සහ 178(1) - (13) දරන වගන්ති වලින් පැන නගින 1 වෙනි කාණ්ඩයේ ගැටීම නොවෙනස්ව පවතියි. |
| 5 | 2023 අංක 5 දරන රතනතිස්ස සාම පදනම (සංස්ථාගත කිරීමේ) පනත | ගැටීමක් නැත | |
| 6 | 2023 අංක 6 දරන පාර්ලිමේන්තු අයවැය කාර්යාලය පනත | ගැටීමක් නැත | තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32 වෙනි වගන්තිය මගින් විධිවිධාන සලසා ඇති තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීතිය මෙම පනතෙහි විධිවිධාන සලසා ඇති කරුණු හෝ එයට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් අදාළ වන බව පැහැදිලිව දක්වා ඇත. |
| 7 | 2023 අංක 7 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 8 | 2023 අංක 8 දරන ගුවන් ප්‍රවාහන (සංශෝධන) පනත | ගැටීමක් නැත | |

| අනු අංකය | පනතේ නම | ගැටුමේ කාණ්ඩය | වගන්ති |
|---|---|---|---|
| 9 | 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත | 1 වෙනි කාණ්ඩය | රහස්‍යභාවය පිළිබඳ වගන්ති:<br><br>28. (1) කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු, අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ යම් සේවානියුක්තයකු හෝ 27 වන වගන්තිය යටතේ සේවා ලබා ගනු ලැබ සිටින වෙනත් යම් තැනැත්තකු විසින්, මේ පනතේ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්ය සඳහා හෝ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා මේ පනත යටතේ යම් විධිවිධානයක් සාදනු ලැබ ඇති අවස්ථාවක දී මිස, මේ පනත යටතේ වූ ස්වකීය බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී තමාට ලැබුණු හෝ තමා විසින් දැනුවත් වූ යම්<br><br>තොරතුරු හෙළිදරව් කරනු නොලැබිය යුතු ය.<br><br>(2) කොමිෂන් සභාවේ සෑම සාමාජිකයකු ම, අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ සෑම නිලධරයකු හෝ සේවා නියුක්තයකු ම හෝ 27 වන වගන්තිය යටතේ සේවා ලබා ගනු ලැබ සිටින වෙනත් යම් තැනැත්තකු ම, තමා ස්වකීය ධුරයේ කාර්ය සඳහා ඇතුළත් වීමට පෙරාතුව, මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා හැර, මේ පනත යටතේ වූ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී තමා වෙත ලැබුණු හෝ තමා විසින් දැනුවත් වූ කිසිදු තොරතුරක් හෙළිදරව් නොකරන බවට ප්‍රකාශයක් අත්සන් කරනු ලැබිය යුතු ය.<br><br>(3) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව සහ කොමිෂන් සභාවේ අවසරය ඇතිව, පොදු මහජන යහපත වෙනුවෙන් අවශ්‍ය බවට කොමිෂන් සභාව විසින් සලකන යම් තොරතුරු, මහජනතාව කෙරෙහි වූ කොමිෂන් සභාවේ වූ විනිවිදභාවය සහ වගකීම පිළිබඳ කාර්ය සඳහා මුද්‍රිත මාධ්‍යයේ, ජනමාධ්‍යයේ හෝ සමාජ මාධ්‍යයේ පළ කිරීමේ කාර්ය සඳහා හෙළිදරව් කරනු ලැබිය හැකි ය.<br><br>73. (1) මේ පනත යටතේ යම් වරදක් සිදු කරනු ලැබ ඇති බවට හෝ සිදු කරනු ලැබ ඇති බවට සැක කරන හෝ සිදු කිරීමට ඉඩ ඇති බවට කොමිෂන් සභාවට රහසිගතව විශ්වාස කටයුතු තොරතුරක් ලැබෙන අවස්ථාවක දී, එම තොරතුරු සහ දැනුම් දෙන්නාගේ අනන්‍යතාවය හෙළිදරව් නොකළ යුතු අතර තොරතුරු සපයන්නා සහ ඒ තොරතුරුවලට අදාළ කාරණා යම් අධිකරණයක්, විනිශ්චය සභාවක් හෝ වෙනත් අධිකාරියක් ඉදිරියේ යම් නඩු කටයුත්තක දී හෙළිදරව් කරනු නොලැබිය යුතු ය. |

| අනු අංකය | පනතේ නම | ගැටුමේ කාණ්ඩය | වගන්ති |
|---|---|---|---|
| 10 | 2023 අංක 10 දරන අපරාධයක වින්දිතයින් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත | 3 වෙනි කාණ්ඩය | රහස්‍යභාවය<br><br>96. (1) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට බලාත්මකභාවයක් දීමේ කාර්යය සඳහා අවශ්‍ය වන්නේ නම් මිස, යම් නඩු කටයුත්තක දී, අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු මේ පනත යටතේ සහාය හෝ ආරක්ෂාව ලබන්නේ ද යන්න හෝ ලබා ඇත්තේ ද යන්න හෙළිදරව් කිරීමට කිසිදු තැනැත්තකුට බලපෑමක් නොකරනු ලැබිය යුතු ය.<br><br>(2) මේ පනතේ විධිවිධානවලට බලාත්මකභාවයක් දීමේ කාර්යය හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනුකූල වීමේ කාර්යය සඳහා හැර, කිසිදු තැනැත්තකු විසින්, අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු මේ පනත යටතේ සහාය හෝ ආරක්ෂාව ලබන්නේ ද යන්න හෝ ලබා ඇත්තේ ද යන්න වෙනත් යම් තැනැත්තකුට හෙළිදරව් නොකරනු ලැබිය යුතු ය. |
| 11 | 2023 අංක 11 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධනය) පනත | ගැටීමක් නැත | |
| 12 | 2023 අංක 12 දරන විසර්ජන (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 13 | 2023 අංක 13 දරන ශ්‍රී ලංකා බදුකරණ කාර්යායතනය (සංස්ථාගත කිරීමේ) (සංශෝධනය) පනත | ගැටීමක් නැත | |
| 14 | 2022 අංක 14 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතග | ප්‍රගතියක් නැත | දේශීය ආදායම් (සමාව දීම විධිමත් කිරීමේ) පනතේ (2004 අංක 10 දරන) 5 වෙනි වගන්තියේ රහස්‍යභාවය පිළිබඳ වගන්තිය, දේශීය ආදායම් පනතේ (2006 අංක 10 දරන) අංක 203 සිට 209 (1) - (13) දක්වා වන වගන්ති සහ දේශීය ආදායම් පනතේ (2000 අංක 38) දරන අංක 173 සහ 178(1) - (13) දරන වගන්ති වලින් පැන නගින 1 වෙනි කාණ්ඩයේ ගැටීම නොවෙනස්ව පවතියි. |

| අනු අංකය | පනතේ නම | ගැටුමේ කාණ්ඩය | වගන්ති |
|---|---|---|---|
| 15 | 2023 අංක 15 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 16 | 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත | ගැටීමක් නැත | 10. (1) 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ අවසර දී ඇති තාක් දුරට, පාලක මණ්ඩලයේ රැස්වීම්වල කටයුතු රහසිගත විය යුතු ය. පාලක මණ්ඩලය විසින් යම් කාරණයක් සම්බන්ධයෙන් ගනු ලබන යම් තීරණයක්, අවශ්‍ය යයි එය විසින් සලකන්නේ නම් ප්‍රසිද්ධියට පත් කරනු ලැබිය හැකි ය.<br><br>(2) පාලක මණ්ඩලයේ එක් එක් රැ ස්වීම්වල කාර්ය සටහන් ඒ රැස්වීමේ මුලසුන දරන තැනැත්තා සහ පාලක මණ්ඩලයේ ලේකම්වරයා විසින් අත්සන් කරනු ලැබිය යුතු ය.<br><br>(3) පාලක මණ්ඩලයේ එක් එක් රැ ස්වීම්වල කාර්ය සටහන් ලිඛිතව පවත්වාගෙන යනු ලැබිය යුතු අතර, ඒ සටහන් යටත් පිරිසෙයින් වසර දොළහක කාලසීමාවක් සඳහා රඳවා තබා ගනු ලැබිය යුතු ය. |
| 17 | 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත | ගැටීමක් නැත | |
| 18 | 2023 අංක 18 දරන ශ්‍රී ලංකා වරලත් ප්‍රවාහන ආයතනය (සංස්ථාගත කිරීම) (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 19 | 2023 අංක 19 දරන ආයුර්වේද (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 20 | 2023 අංක 20 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 21 | 2023 අංක 21 දරන මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත | ගැටීමක් නැත | |
| 22 | 2023 අංක 23 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය (සංශෝධන) පනත | ගැටීමක් නැත | |

| අනු අංකය | පනතේ නම | ගැටුමේ කාණ්ඩය | වගන්ති |
|---|---|---|---|
| 23 | 2023 අංක 24 දරන සිවිල් ගුවන් සේවා (සංශෝධන) පනත | ප්‍රගතියක් නැත | 1 වෙනි කාණ්ඩය<br>57 වෙනි වගන්තියේ රහස්‍යභාවය පිළිබඳ වගන්ති, සහ වගන්ති අංක (1) සමග 60(3) වෙනි වගන්තියේ ආයතනික ස්වාධීනත්වය පිළිබඳ වගන්ති. |
| 24 | 2023 අංක 25 දරන බලපිටිය ශ්‍රී රාහුලාරාම පුරාණ විහාරස්ථ සාමණේර අකල්ප සංවර්ධන භික්ෂු විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) පනත | ගැටීමක් නැත | |
| 25 | 2023 අංක 26 දරන ජ්‍යෙෂ්ඨ උපදේශක නීතිඥ බහුමානය ප්‍රදානය කිරීමේ පනත | ගැටීමක් නැත | |
| 26 | 2023 අංක 27 දරන ධීවර හා ජලජ සම්පත් (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 27 | 2023 අංක 28 දරන දූෂණ විරෝධී (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 28 | 2023 අංක 29 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 29 | 2023 අංක 30 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 30 | 2023 අංක 31 දරන ගලහ හඳුවතී ජාතික භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථාන භාරය පනත | ගැටීමක් නැත | |
| 31 | 2023 අංක 32 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | ප්‍රගතියක් නැත | 65(අ), (ආ) සහ (ඇ) වගන්ති අනුව රහස්‍යභාවය පිළිබඳ වගන්ති, සහ 73 1,2, 3, සහ 4 වගන්තිය |
| 32 | 2023 අංක 33 දරන මුදල් පනත | ගැටීමක් නැත | |
| 33 | 2023 අංක 34 දරන විසර්ජන පනත | ගැටීමක් නැත | |

| අනු අංකය | පනතේ නම | ගැටුමේ කාණ්ඩය | වගන්ති |
|---|---|---|---|
| 2024 වර්ෂය | | | |
| 1 | 2024 අංක 1 දරන ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය | ගැටීමක් නැත | |
| 2 | 2024 අංක 2 දරන සමථ මණ්ඩල (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 3 | 2024 අංක 3 දරන ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 4 | 2024 අංක දරන වංචා වැළැක්වීමේ (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 5 | 2024 අංක 5 දරන සමථකරණය තුළින් ඇතිවන්නා වූ අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුම් පිළිගැනීමේ සහ බලාත්මක කිරීමේ පනත | ගැටීමක් නැත | |
| 6 | 2024 අංක 6 දරන නොතාරිස් (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 7 | 2024 අංක 7 දරන ජාතික ජල ශාස්ත්‍රීය පනත | ගැටීමක් නැත | |
| 8 | 2024 අංක 8 දරන අධිකරණයකට, විනිශ්චය අධිකාරයකට හෝ ආයතනයකට අපහාස කිරීම පනත | ගැටීමක් නැත | |
| 9 | 2024 අංක 9 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත | 1 වෙනි කාණ්ඩය | 51. මේ පනතේ විධිවිධාන සහ වෙනත් ලිඛිත නීතියක් අතර අනනුකූලතාවයක් හෝ ගැටීමක් ඇති වුවහොත්, එවිට, මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය. |
| 10 | ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 11 | 2024 අංක 12 දරන ශ්‍රී බාලාභිවෘධි වර්ධන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත | ගැටීමක් නැත | |
| 12 | 2024 අංක 13 දරන සමාධි ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත | ගැටීමක් නැත | |
| 13 | 2024 අංක 14 දරන දස්සනා බෞද්ධ සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත | ගැටීමක් නැත | |

| අනු අංකය | පනතේ නම | ගැටුමේ කාණ්ඩය | වගන්ති |
|---|---|---|---|
| 14 | 2024 අංක 15 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 15 | 2024 අංක 16 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | ප්‍රගතියක් නැත | එකතු කළ අගය මත බදු පනත (2002 අංක 14) නැමති මුල් පනත තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත සමග 2 වෙනි කාණ්ඩයේ ගැටීමක් ඇති කරයි. |
| 16 | 2024 අංක 17 දරන සුරක්ෂිත ලත් ගනුදෙනු පනත | ගැටීමක් නැත | |
| 17 | 2024 අංක 18 දරන ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 18 | 2024 අංක 19 දරන භාර ලදුපත් (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 19 | 2024 අංක 20 දරන උකස් (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 20 | 2024 අංක 21 දරන කල්බදු මූල්‍යකරන (සංශෝධන) පනත | ප්‍රගතියක් නැත | 2 වෙනි කාණ්ඩය<br>අධ්‍යක්ෂවරයා විසින් හෝ අධ්‍යක්ෂවරයා විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින් මේ පනත යටතේ ස්වකීය කාර්ය ඉටුකිරීමේ දී ලබා ගත් යම් තොරතුරක් හෝ කරුණක් අනාවරණය කිරීම -<br>(අ) එසේ කිරීමට -<br>සග අධිකරණයක් විසින්<br>සසග ඒ තොරතුරු හෝ කරුණු<br>අදාළ වන තැනැත්තා විසින්<br>නියම කරනු ලැබූ විටක දී;<br>(ආ) මේ පනත යටතේ ස්වකීය කාර්ය ඉටු නිරීමේදී හෝ<br>(ඇ) මේ පනතේ හෝ වෙනත් යම් නීතියක යම් විධිවිධානයකට අනුකූලව කටයුතු කිරීමේ දී<br>හැර කරනු නොලැබිය යුතු ය. |
| 21 | 2024 අංක 22 දරන දේශීය භාර ලදුපත් (සංශෝධන) පනත | ගැටීමක් නැත | |

| අනු අංකය | පනතේ නම | ගැටලුමේ කාණ්ඩය | වගන්ති |
|---|---|---|---|
| 22 | 2024 අංක 23 දරන සමාගම් (සංශෝධන) පනත | ප්‍රගතියක් නැත. | 3 වන කාණ්ඩය යටතේ රහස්‍යභාවය පිළිබඳ විධිවිධාන<br><br>((1) යම් සමාගමක කොටස්වල අයිතිය පිළිබඳව විමර්ශනය කොට වාර්තා කිරීම සහ සමාගම සම්බන්ධයෙන් අන්‍යාකරයකින් සමාගමේ (තථ්‍ය හෝ දෘශ්‍යමාන) සාර්ථකත්වයට හෝ අසාර්ථකත්වයට මූල්‍යමය වශයෙන් සම්බන්ධතාවයක් ඇති හෝ ඇතිව සිටි, නැත හොත් ප්‍රතිපත්තිය පාලනය කිරීමට හෝ සැලකිය යුතු ආකාරයෙන් ඒ ප්‍රතිපත්තිය කෙරෙහි බලපෑමක් ඇති කළ හැකි නියම තැනැත්තන් නිශ්චය කිරීමේ කාර්යය සඳහා එක් පරීක්ෂකවරයකු හෝ පරීක්ෂකවරයන් වැඩි සංඛ්‍යාවක් පත් කිරීමට සාධාරණ හේතු ඇති බව රෙජිස්ට්‍රාර්වරයාට පෙනී යන අවස්ථාවක රෙජිස්ට්‍රාර්වරයා විසින් එසේ පත් කරනු ලැබිය හැකි ය.<br><br>(9) මේ වගන්ති යටතේ නිකුත් කරන ලද වාර්තාවක යම් කොටසක් අනාවරණය නොකිරීමට මනා හේතු ඇති බව රෙජිස්ට්‍රාර්වරයා සලකන්නේ නම්, රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ කොටස අත්හැර 176 වන වගන්තිය යටතේ වාර්තාව අනාවරණය කරනු ලැබිය හැකි ය. |

| අනු අංකය | පනතේ නම | ගැටුමේ කාණ්ඩය | වගන්ති |
|---|---|---|---|
| 23 | 2024 අංක 24 දරන බැංකු (සංශෝධන) පනත | ප්‍රගතියක් නැත | 2 වෙනි කාණ්ඩය<br><br>බලපත්‍රලාභී වාණිජ බැංකුවක ව්‍යාපාර කටයුතු කිරීමෙහි නිරත වී සිටින සෑම අධ්‍යක්ෂවරයෙක් ම, සෑම කළමනාකරුවෙක් ම, සෑම නිලධාරින් ම හෝ වෙන යම් තැනැත්තෙක් ස්වකීය රාජකාරි භාර ගැනීමට පෙර, බැංකුවේ සියලු ම ගනුදෙනු, එහි ගනුදෙනුකරුවන් සහ යම් පුද්ගලයෙකුගේ ගිණුම්වල තත්ත්වය පිළිබඳව සහ ඒවාට අදාළ වන සියලු ම කරුණු පිළිබඳව දැඩි රහස්‍යභාවයක් ආරක්ෂා කරන බවට පොරොන්දු වෙමින් ප්‍රකාශයක් අත්සන් කළ යුතු අතර, තමන්ගේ රාජකාරි ඉටුකිරීමේ දී තමන්ට දැනගැනීමට ලැබෙන වෙනත් කිසිදු කරුණක් පහත සඳහන් අවස්ථාවල දී හැර හෙළි නොකරන බවට එම ප්‍රකාශය මගින් පොරොන්දු විය යුතු ය:<br><br>(අ) එසේ කරන ලෙසට -<br>i. අධිකරණයක් විසින් නියම කර ඇති විට;<br>ii. එම කරුණු අදාළ වන පුද්ගලයා විසින් ඉල්ලා සිටින විට;<br>(ආ) තම රාජකාරි ඉටු කිරීමේදී එසේ කළ යුතු වන විට; සහ<br>(ඇ) මෙම පනතෙහි හෝ වෙන යම් නීතියක කවර හෝ විධිවිධානයකට අනුකූල වනු පිණිස අවශ්‍ය කරන විට. |
| 24 | 2024 අංක 25 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 25 | 2024 අංක 26 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 26 | 2024 අංක 27 දරන බෙදුම් නඩු (සංශෝධන) පනත | ගැටීමක් නැත | |
| 27 | 2024 අංක 28 දරන සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත | ප්‍රගතියක් නැත | 3 වෙනි කාණ්ඩය<br><br>(1) වෙනි උප වගන්තිය සමග 47(3) සහ (4) වෙනි වගන්ති සහ 56 වෙනි වගන්තිය යටතේ රහස්‍යභාවය පිළිබඳ විධිවිධාන. |

සටහන - parliament.lk නැමති ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වෙබ් අඩවියේ “පනත් සහ පනත් කෙටුම්පත්” යන කොටසෙන් පනත් වෙත ප්‍රවේශ වෙන ලදී. සහතිකය සටහන් කරන ලද පනත් මාර්ගගතව ලබා ගත හැකි අවස්ථාවලදී, ඒවායෙහි කෙටුම්පත් වෙත ප්‍රවේශ වෙන ලදී.

Transparency International Sri Lanka
366, Nawala Road, Nawala,
Rajagiriya,
Sri Lanka.

Phone: +94 11 4 369 781
Fax: +94 11 2 865 777
Email: tisl@tisrilanka.org
Web: www.tisrilanka.org

twitter.com/tisrilanka
lk.linkedin.com/company/tisrilanka
facebook.com/tisrilanka
instagram.com/transparency_sri_lanka
youtube.com/user/tisrilankatube